# රාජ්‍යය, රාජ්‍ය පාලනය හා රජවරු පිළිබඳ බෞද්ධ මතය

**වැලිවිට සෝරත හිමි**

## ආරම්භය

දීඝනිකායේ පාථික වග්ගයේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව පුද්ගලයාගේ සමාජ පරිණාමය සිදු වූ අයුරු විස්තර කර ඇත. මෙම සූත්‍රය දේශනා කරන්නට යෙදුනේ ඩාවින්ගේ සමාජ පරිණාමය පිළිබඳ අදහස් ඉදිරිපත් වන්නට වසර දෙදහසකට පමණ පෙරය. අනෙකුත් ආගමික දාර්ශනිකයින් විසින් පෙන්වා දෙන ලෝකය මැවීමේ න්‍යාය වන නිර්මාණවාදය බුදුරජුන්ගේ පටිච්ච සමුප්පාද දේශනාව හා සම්බන්ධ කළ නො හැකිය. මැවීම සදාකාලයට අයත් තනි සිද්ධියකි. වෙනත් වචනවලින් කියතොත් නිර්මාපකයා ලොව මවන්නේ එක් වරක් පමණි. එතැන් සිට ලෝකය ඉදිරියට පැවතෙමින් යයි. එහෙත් සංවෘත හා විවෘතය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රයේ පෙන්වා දීම මීට හාත්පසින් වෙනස්ය. සූත්‍රයේ පෙන්වා දෙන අන්දමට එය වාර කිහිපයක් තුළ දී සිදුවිය හැකිය. ඒ අනුව මිනිසාගේ සම්භවය හා සමාජයේ



පරිණාමය පිළිබඳ ව තොරතුරු අග්ගඤ්ඤ සූත්‍රයේ දී ක්‍රමානුකූලව ඉදිරිපත් කර ඇත. මේ ලෝකය විනාශ වන අවස්ථාවේ සියලු සත්ත්වයෝ ආභස්සර බ්‍රහ්මලෝකයෙහි උත්පත්තිය ලබන්නාහ. නැවත ලෝකය විවර වූ පසු ආභස්සර බ්‍රහ්ම ලෝකයෙහි ප්‍රීතිය පමණක් අනුභව කරමින් මනෝමය ශරීරයකින් සිටි සත්ත්වයෝ අවකාශය තුළ ඔබිනොබ හැසිරෙන්නාහ. බඹලොව සිට පැමිණි ලෝල ජාතික පළමු පුද්ගලයා දිය කඳක් වී තිබූ රස පොළොව අත ගා එහි රසය බැලීම, අන්‍යයන් එය අනුගමනය කිරීම, ඔවුන් තුළ තෘෂ්ණාව පහළවීම, රස පොළොව අතුරුදහන් වීම, බදාලතා හා භූමි පප්පටක ආදිය ඇතිවීම, සියලු දෙනා පැළැටි භක්ෂණයට හුරුවීම, ආදී ජීවි අජීවි වස්තූන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු එකිනෙක දක්වා තිබේ. ඉන්පසු ස්ත්‍රී පුරුෂ භේදය දැකීම, ඔවුනොවුන් අතර ප්‍රදර්ශනය වීමෙන් සංවාසාදිය සිදුවීම, එය සදාචාර විරෝධී ක්‍රියාවක් බව අන් අයට වැටහීම, ඉන්පසු රහසේ ක්‍රියා කිරීම උදෙසා ගෙවල් දොරවල් තනා ගැනීම, ඉඩකඩම් වෙන්කරවා ගැනීම, ඒ හේතුවෙන් එකිනෙකා අතර කලකෝලාහල ඇතිවීම, එම නිසාම මහාසම්මත යැයි කෙනෙකු පත්කර ගැනීම ආදි තොරතුරු මැනවින් දේශිතය.

## රාජ්‍යය හා රාජ්‍ය පාලනයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ මතය

ඉහත කෙටියෙන් සඳහන් කළ සමාජ පරිණාම තොරතුරු අනුව යමින් රාජ්‍යයක ආරම්භය සිදුවූයේ කෙසේද

යන්න පිළිබඳ විස්තර අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ. මිනිසුන් අතර ඇති වූ කලකෝලාහලවලදී ඇතැම්හු මරණයට පත්වීම, බොරු කීම, සොරකම් කිරීම, ගර්හා කිරීම, ආයුධ ගෙන එකිනෙකා ඇණකොටා ගැනීම ආදිය සිදුවිය. ඉන්පසු එකතු වූ මනුෂ්‍යයින් අතුරින් කෙනෙක් ප්‍රධානත්වයෙහි ලා සැලකීම සුදුසු බව යෝජනා විය. ඔහු විසින් යම් කෙනෙකුට දඬුවම් පැණවීම, පිටුවහල් කිරීම ආදිය සිදු කළ යුතු අතර ඒ වෙනුවෙන් ඔහුට තමන් උපයන හැල් හාල්වලින් භාගයක් දීමට කථිකා කර ගත්හ. මෙයින් පැහැදිලි වන්නේ රාජ්‍යයක ආරම්භයේ සිටම සාමාන්‍ය වැසියා විසින් ප්‍රධානියාට බදු ගෙවීමක් සිදු කර ඇති බවය. මුලින් ම එම පුද්ගලයා හඳුන්වා ඇත්තේ 'මහාසම්මත' යන නාමයෙනි. පසුව ක්ෂේත්‍රයන්ට අධිපති වූ හෙයින් 'ක්ෂත්‍රියවරු' බිහිවූහ. ධාර්මිකව ජනයා පාලනය කරන හෙයින් 'රාජා' යන නාමය පටබැඳින.

**(මහාසම්මතො මහාසම්මතොත්වෙව පඨමං අක්ඛරං උපනිබ්බත්තං. ඛෙත්තානං අධිපතීති ඛො වාසෙට්ඨ ඛත්තියො ඛත්තියොත්වෙව දුතියං අක්ඛරං උපනිබ්බත්තං. ධම්මෙන පරෙ රඤ්ජෙති ඛො වාසෙට්ඨ රාජා රාජත්වෙව තතියං අක්ඛරං උපනිබ්බත්තං)**[1]

පෘථුවිවාසීන්ගේ පරිභෝජනය පිණිස ස්වභාව ධර්මයෙන් ලබාදුන් ඉඩකඩම් තමන්ගේ ඕනෑ එපාකම් මත වැට කොටු ගසා වෙන් කර ගැනීම නිසා අපේ ඉඩම, අපේ සමාජය යන පොදු හැඟීමකට අවකාශ සලසන ලද්දේය. නව ප්‍රවණතාවක් ඇතිවීමෙන් සිදු වූ සමාජමය වෙනස කෙතරම්



ප්‍රබල වූයේ ද යත් නීතිය හා සාමය පවත්වාගෙන යාමට ක්‍රියාත්මක වෙමින් පැවති පාලන ක්‍රමය ප්‍රමාණවත් නොවූ හෙයින් ක්ෂණික තීරණයක් ගත්තේය. අවසානයේ දී රජෙකු තෝරා පත් කර ගැනීමට ඔවුන් සතිටුහන් කරන ලද්දේ මේ තත්ත්වය යටතේය.

අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් මෙම විස්තරයට අනුව ආරම්භක අවස්ථාවේ දී ම අරාජික පාලනයකින් තොර සමාජයක් බිහි වී තිබූ බව පෙනේ. එම සමාජය තුළ පැවති රාජ්‍යය බිහි වීමේ දී එහි ගිවිසුම් පද්ධතියක් ද පැවතුණි. මෙම ගිවිසුම එකච්ඡන්දයෙන් හෝ බහුතරයක ඡන්දයෙන් අනුමත වූ ඒවාය. රාජ්‍යයක් ගෙනයාමේ දී මෙවැනි ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් තිබීම අනිවාර්ය අංගයක් වූයේ මේ හේතූන් නිසාය. සංවාසයේ යෙදීම සදාචාර විරෝධී ක්‍රියාවක් බව පිළිගත් ඔවුහු ඊට දඬුවම් නියම කළහ. ප්‍රසිද්ධියේ මෛථුන ධර්මයේ හැසුරුණ අයට ''වසලිය නැසෙව. වසිලිය වැනසෙව. කෙසේ නම් සත්ත්වයෙක් තවත් සත්ත්වයෙකුට මෙබන්දක් කරන්නේදැයි කියා පස් ඇට හා ගොම ගැසූ බව සඳහන් වේ.[2] මෙය සාමාන්‍ය දඬුවමක් යැයි කෙනෙකුට හැඟී ගියත් සූත්‍රයේ ම සඳහන් වන විස්තරයට අනුව යම් කෙනෙක් ප්‍රසිද්ධියේ මෛථුන ධර්මයේ හැසුරුණේ නම් ඔහුට මාස තුනක් යන තෙක් ගමට හෝ නියම් ගමට ඇතුල් වීමට අවසර නොලැබුණි. සහල් පරිභෝජනයේ දී ගොඩගසා ගැනීම අසද්ධර්මයන් පහළවීමට හේතු වූ බව පවසා වෙන වෙනම වැට කඩොලු බැඳ ඉඩකඩම් වෙන් කර ගත්හ. පළමුවර හා දෙවෙනි වර ඔහුට අවවාද දී අත්හැරියේය.

එහෙත් තෙවෙනි වර එම වරද කළ පසු දඬු මුගුරු ගෙන තාඩන පීඩන කළහ. ඊටපසු සොරකම, ගැරහීම, බොරු කීම ආදිය ඇතිවිය. වරදට දඬුවම් දීම සිදු වූ අයුරු මෙයින් පැහැදිලි වේ. එම දඬුවම් දීම අවිනිශ්චිත, අසංවිධිත වූ නිසා වඩාත් ක්‍රමානුකූල බවක් ඇති කිරීම් වස් නව සංස්ථාවක් ගොඩ නැගිය යුතු බව සිතා රාජ්‍යත්වය ස්ථාපනය කිරීමට සිදුවිය. පසුව රාජ්‍යයේ අනුමත ක්‍රමයට අනුගත වීමට ඔවුන්ට සිදු විය.

සමාජවිද්‍යා දේශපාලන විද්‍යා ආදි ගුරුකුලයන් පවසන පරිදි රාජ්‍යත්වය ස්ථාපනය කිරීමට හේතු වූයේ මිනිසුන් අතර පැවති ඇති නැති පරතරය නොව බොරුකීම, ප්‍රාණඝාතය, සොරකම් කිරීම ආදී අකුසල ධර්මයන් සිදුකළ නිසාය. මෙය බුදුදහමේ දේශිත ක්‍රමවේදය හා සැසඳේ. මුලින් සිටි අය සොරකම් කළේ නැතිබැරි කමට නොවේ. මෙය පොදුවේ දුප්පත් පොහොසත්, වර්ණ දුර්වර්ණ, බාල මහලු, ස්ත්‍රී පුරුෂ සියලු දෙනාට පොදු වූ ගති පැවතුම් විය. පරමාදර්ශී සමාජයක් ගොඩනැගීම උදෙසා ඊට අනුගත වූ පුද්ගලයෙක් අවශ්‍ය විය. ඒ අනුව මුල් කාලයේ රජු යැයි සම්මත කරගත් පුද්ගලයා අන් අයට ක්‍රියාවෙන් පමණක් නොව ගතිගුණවලින් ද පරමාදර්ශී පුද්ගලයෙකු විය. ඔහුට යම් දෙයක් පිළිබඳ තීරණ ගැනීමේ ඥාණයක් තිබියය යුතු විය. මෙසේ රජෙකු තෝරා ගැනීමේ දී සමාජය ගත් තීරණය එදාට පමණක් නොව වර්තමානයට ද අනාගතයට ද වලංගු වන බව කිව හැකිය.



ආදි මානවයා තුළ අන්‍යයන්ගේ කටයුතු විෂයෙහි අධිකාරය ඇති පුද්ගලයෙකු තෝරාපත් කර ගැනීමට තීරණය කිරීම තුළින් ඔවුන් එතරම් පරිපාකයකට පැමිණ තිබුණු බව ඉහත දැක්වූ විමසුමෙන් පැහැදිලි වේ. අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වන අන්දමට මිනිසුන් අතර රජෙකු බිහි වූයේ පහත දැක්වෙන ක්‍රමයෙනි. ''ඉක්බිති ඒ සත්ත්වයෝ එක්රැස් වූහ'' (සන්නිපතිංසු) එක්රැස්ව හවත්නි යම් කෙනෙකු කෙරෙහි සොරකම පැනෙන්නේද, ගැරහුම පැනෙන්නේද, මුසා බිණීම් පැනෙන්නේද, දඬු ගැන්ම පැනෙන්නේද, ඒ සතුන් කෙරෙහි එසේ ලාමක අකුසල ධර්ම කෙනෙක් පහළ වූහ. අපගෙන් යමෙක් දොස් නගන්නාට මොනවට දොස් නගන්නේද, ගැරහිය යුත්තහුට මොනවට ගරහන්නේද, නෙරපිය යුත්තහු මොනවට නෙරපන්නේද, අපි එසේ වූ එක් සත්ත්වයෙක් සම්මත කර ගනුමෝනම් (සම්මන්නෙය්‍යාම) ඉතා යෙහෙකි. අපි වූ කලී ඔහුට හැල් කොටසක් (සාලීනං භාගං) දෙන්නෙමුයි කතිකා කරගත්හ. ඉක්බිති ඒ සත්ත්වයෝ යම් සත්ත්වයෙක් ඔවුන් අතරින් වඩා රූප සම්පන්නද (අභිරූපතරො) වඩා දැකුම් කළු ද (දස්සනීයතරො) වඩා සිත් පහළවන සුළු ද (පාසාදිකතරො) වඩා මහ තෙදැත්තේද (මහෙසක්ඛතරො) ඒ සත්ත්වයා කරා එළඹ හවත් සත්ත්වය, මෙහි එන්න. දොස් නැගිය යුත්තාට නිසි පරිදි දොස් නගන්න. ගැරහිය යුත්තාට මොනවට ගරහන්න. නෙරපිය යුත්තහු මොනවට නෙරපන්න. අපි වනාහි ඔබට හැල් කොටසක් දෙන්නෙමු'යි කීහ.[3]

මුල්ම රජතුමා තෝරාපත් කර ගැනීමේදී මහජන ඡන්දයකට අනුරූප වන සේ තෝරා ගැනීමේ පිළිවෙතක්

මුල දී තිබුණු බව මෙයින් පැහැදිලි වේ. මෙම තෝරා ගැනීමේ දී ඔහු කෙබඳු පුද්ගලයෙක් වියයුතුදැයි තීරණය කරන ලද්දේද මිනිසුන් විසිනි. ඒ වෙනුවෙන් ඔහුට හිමිවන වස්තුව ද තීරණය කළේ ඔවුන්මය. තෝරා ගැනීමට බලාපොරොත්තු වූ පුද්ගලයා ද ඊට අනුගත වී පත් වූ බව පෙනේ. තේරී පත් වූ පුද්ගලයාත් මහජනයාත් අතර ඇති වූ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍යාත්වය පහළ වූ බව මින් ස්ථිරව අනාවරණය වේ. රාජ්‍යාත්වයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ මතය මෙයයි. රාජ්‍යය කරවන රජුට පවතින අණසක පිළිබඳ තොරතුරු ද මෙහි සඳහන් වේ. එය ද තීරණය කර ඇත්තේ මිනිසුන් විසිනි. ක්‍රියාත්මක කළ යුත්තේ රජුය. මුල් කාලයේ මිනිසුන්ට පැවතියේ සුළු දඬුවම් ක්‍රමයකි. වැරදි කරන පුද්ගලයාට දොස් නැගීම, ගැරහීම ආදිය මෙන් ම මාසයක දෙකක වැනි කාලයකට මිනිසුන් අතරින් වෙන්ව වාසය කිරීමට සිදුවීම ආදිය සුළු දඬුවම් විය. එහෙත් රජ අණ ඊට වඩා ප්‍රබල විය. පිටුවහල් කිරීමේ ක්‍රමය මුල් රජුගේ පටන් පැවත ආවකි. එසේ පිටුවහල් කිරීම මාසයකට දෙකකට අදාළ වන්නේ නැත. එසේම ඔහුගේ රාජ්‍යය පවතින රාජධානියෙන් එපිටට ඔහු පිටුවහල් වියයුතුය. ගිවිසුමේ සීමා යටතේ වරදකරුවන්ට දඬුවම් දීමේ නිදහස රජුට ප්‍රදානය කෙරුණු බව මින් පැහැදිලිය.

රජ කෙනෙක් තෝරා ගැනීමේ මූලික අරමුණ වූයේ කෙත්වතු ආරක්ෂා කර ගැනීම පිණිස බලසම්පන්නයෙකු සිටිය යුතුය යන්න මූලිකත්වයෙහි ලා යොදාගෙනය. එබැවින් ඛත්තිය යන නාමයෙන් හඳුන්වනු ලබන කෙනෙක් ඒ සඳහා



යොදා ගැනින. මේ අනුව ඛත්තය කුලයට අයත් පුද්ගලයාගේ මුල්ම කෙනා කෙත්වතු ආදියට අධිපතියාය යන අර්ථයෙන් ඛිහිවිය. එම පුද්ගලයාට රාජා යන නාමය ලබා දී ඇති අතර අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ඔහු සියලු දෙනා සතුටු කරන පුද්ගලයාය.[4] සතුටු කළයුත්තේ කෙසේද යන්න පිළිබඳ සටහන් නොවුවත් ඔහු අනිවාර්යයෙන් මහජනයාගේ ඕනෑ එපාකම් තේරුම් ගැනීමත් ඔවුන්ගේ දේපල ආරක්ෂා කරදීමත්, සමාජ නීතිය හා සාමය පැවැත්වීමත් ඉටු කළයුතු බව ගිවිසුම් මාර්ගයෙන් අවබෝධ කරගත හැකිය. මහාවස්තුවට අනුව රජු යනු සහල් නිෂ්පාදනයේ පංගු කාරයෙකු වීමට අයිතිවාසිකම් ඇති තැනැත්තාය.[5] රජු රටේ ආරක්ෂකයාය. ආරක්ෂාවට යම් තර්ජනයක් ඇති වන්නේ නම් නායකයාගේ තත්ත්වයට එය බරපතල හානියකි. ඒ අනුව සියලු දෙනාගේ ගැටලු විසඳීමේ දී එම පුද්ගලයාට පමණක් එය කළ නොහැකි විය. එබැවින් ඔහු තමන්ට ම අයිති හමුදාවක් ඇති කර ගත්තේය.

රාජ්‍යාත්වය මිනිසා විසින් නිර්මාණය කරන ලද්දක් නිසා රජ කෙනෙක් තෝරාපත් කර ගැනීම මෙන්ම නෙරපා හැරීමේ බලය ද ඔවුන් සතු වන බවට කදිම නිදසුනක් අග්ගඤ්ඤ සූත්‍රයේ එයි. ජනතා පරමාධිපත්‍යය සම්පූර්ණයෙන් උල්ලංඝනය කිරීමේ හැකියාවක් පත් කරගන්නා ලද මහාසම්මත පුද්ගලයාට නොමැත. ඔහු නොමනා අයුරින් ක්‍රියා කරන්නේ නම් පන්නා දැමීමේ අයිතිය ද මිනිසුන්ට හිමි වී තිබූ බව දෙපිරිස අතර ඇති වූ ගිවිසුමෙන් මනාව පෙනේ. රජතුමා දැහැමින් ජනයා සතුටු

කළ යුතු විය. (ධම්මේන පරෙ රඤ්ජයතීති බො වාසෙට්ඨ රාජා රාජත්වේව තතියං අක්ඛරං උපනිබ්බත්තං)[6]

රාජ්‍ය පාලනය කිරීමේ දී ද රජු විසින් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග පිළිබඳ බොහෝ තොරතුරු මූලාශ්‍ර ග්‍රන්ථවලින් උපුටා ගත හැකිය. මේ ලොව පහළවන ශ්‍රේෂ්ඨතම රාජ්‍ය පාලකයා සක්විති රජය. සක්විති රජ කෙනකුට චක්‍රරත්නය ඇතුළු රත්නයෝ හතක් පහළ වෙති. එනම් චක්‍රරත්නය, හත්ථිරත්නය, අස්සරත්නය, මණිරත්නය, ස්ත්‍රී රත්නය, ගහපති රත්නය හා පිරිවර සේනා රත්නය යන ඒවාය. එසේම ඔහුට අගමෙහෙසිය ඇතුළු අන්තඃපුර ස්ත්‍රීන්හට දහසකට වැඩි පුත්‍රයෝ ඇති වන්නාහ. ඔහු චනාහි සාගරය කෙළවර කර ඇති මුළු මහත් පෘථුවිය දඬුවමෙන්, ආයුධයෙන් තොරව හා ධර්මයෙන් යුක්තව සියලු දෙනා ජයග්‍රහනය කොට පාලනය කරන්නෙකි. එසේ පාලනය කිරීමේ දී ඔහු විසින් දස සක්විති දම් පිරිය යුතුය.[7] දස සක්විති වත් මෙසේය.

1. ධර්මය ඇසුරු කොට ධර්මයට සත්කාර කරමින්, ගරු කරමින්, සම්මානන කරමින්, පුදමින් ධාර්මික ආරක්ෂාවක් ඇතුළු ජනයා කෙරෙහි දැක්විය යුතුය.
2. බලකාය කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.
3. ක්ෂත්‍රියන් කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.
4. බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.



5. නියම්ගම් ජනපදවාසීන් කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.
6. ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.
7. සිවුපා හා පක්ෂීන් කෙරෙහි ආරක්ෂාව සැලසිය යුතුය.
8. තම රාජ්‍යයේ අධර්මය නොපැතිරවිය යුතුය.
9. තම රාජ්‍යයේ දිළින්දන් සිටිනම් ඔවුන්ට ධනය උත්පාදනය කළ යුතුය.
10. ශාන්ත වූ දැමුණු ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටිනම් විටින් විට ඔවුන් කරා ගොස් ධර්මය කුමක්ද, කළ යුත්ත කුමක්ද? නොකළ යුත්ත කුමක්ද? යහපත අහයපත කුමක්ද? ආදිය විමසා බලා ඒ අනුව ක්‍රියා කළ යුතුය.

ඉහතින් සඳහන් කළ සියලු සක්විති දම් සුරකින්නාට සක්විති රජ කෙනෙක් වශයෙන් සිටිය හැකිය. එවැනි ක්‍රියාවන් නොකරන විට රටතුළ ඇතිවන්නේ දස අකුසල කර්ම වැනි අධර්මකාරී ක්‍රියාවන්ය. එවිට පව්වැඩ කෙරෙහි යොමුවන මිනිසුන්ගේ ආයුෂය, වර්ණය ආදිය ගිලිහි යනු ලැබේ. චක්කවත්තිසීහනාද සූත්‍රයට අනුව විජිතාවි නම් සක්විති රජුගේ පටන් සක්විති රජවරු හත් දෙනෙක් දස සක්විතිවත් පූරණය කරමින් රාජ්‍යය ගෙන ගොස් ඇත. එහෙත් අටවෙනි රජු එසේ සක්විතිවත් වලින් දිළින්දන්ට ධනය උත්පාදනය කිරීමට අවස්ථාවක් නොදී ඔවුන්ගේ ජීවනෝපාය සම්බන්ධයෙන් කටයුතු නොකළ නිසා සොරකම

ඇතිවිය. සොරකම් බහුලවීමෙන් පසු ප්‍රාණඝාතය ඇතිවිය. මේ ආකාරයට දස අකුසල ධර්මයන් සමාජය තුළ ඉස්මතු වූ නිසා සියලු දෙනාගේ ආයු වර්ණාදිය පිරිහී ගොස් ඇත. ආයුෂ අසූදහසක් වූ ඔවුන්ගේ පුත්‍ර පරම්පරාව ක්‍රමයෙන් අවුරුදු හතළිස්දහස දක්වා අඩු විය. **(අධනානං ධනෙ අනනුප්පදියමානෙ දාලිද්දියං වෙපුල්ලමගමාසි. දාලිද්දියෙ වෙපුල්ලං ගතෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසංඛාතං ආදියි.......පාණාතිපාතො වෙපුල්ල මගමාසි පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ තෙසං සත්තානං ආයුපි පරිහායි. වණ්ණො පි පරිහායි. තෙසං ආයුනා පි පරිහායමානානං වණ්ණෙ පි පරිහායමානානං අසීති වස්ස සහස්සායුකානං මනුස්සානං චත්තාරීස වස්ස සහස්සයුකා පුත්තා අහෙසුං)**[8]

එසේම යම්කිසි චක්කවත්ති රජ කෙනෙක් රාජ්‍ය විචාරන අවස්ථාවේ ඔහු විසින් තම රට වැසියා කෙරෙහි අනුගමනය කළයුත්තේ දඬු නැති ආයුධ නැති ධාර්මික වූ ක්‍රියා පිළිවෙතකි. එවැනි රජුට කිසිදු ආකාරයේ බලපෑමක් කිසිවෙකුගෙන් සිදුවන්නේ නැත. (සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති)[9]

රාජ්‍ය පාලනයේදී තවත් වැදගත් ක්‍රියාවක් වනුයේ සප්ත අපරිහානි ධර්ම බැහැර කිරීමය. පිරිහීමට හේතුවන එම ක්‍රියාවන් අනුගමනය කිරීම රජ්‍යයේ පිරිහීමට ලක් වේ. සප්ත අපරිහානි ධර්ම අනුගමනය කළ ලිච්ඡවී රජවරු පරාජය කළ



නොහැකි බව අජාසත් රජුගේ පුරෝහිත වස්සකාර බ්‍රාහ්මණයාට බුදුරජුන් පෙන්වා දුන් අයුරු මහාපරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වේ. එම අපරිහානි ධර්ම පහත පරිදි වේ.[10]

1. නිතර රැස්වීම, නිතර රැස්වෙන සුළු බව තිබීම.
2. සමගිය රැස්වීම, සමගිව විසිරයාම, වජ්ජකරණිය ධර්ම මැනවින් ඉටුකිරීම
3. නොපැනවූ නීති නොපැනවීම
4. වජ්ජීන්ගේ වැඩිමහල්ලන්ට සත්කාර, සම්මාන, ගරුකිරීම්, පූජාකිරීම් කිරීම
5. කුල ස්ත්‍රීන් කුල කුමරියන් කෙරෙහි බලහත්කාරකම් නොකිරීම
6. වජ්ජීන්ගේ චෛත්‍යයන් කෙරෙහි සත්කාර සම්මාන ගරු බුහුමන් දැක්වීම
7. පැමිණි, පැමිණෙන හා පැමිණෙන්නා වූ රහතුන් කෙරෙහි රක්ෂාවරණය සැපයීම

පිරිහීමට හේතුභූත වන්නා වූ අපරිහානි ධර්ම කෙරෙහි වැඩි අවධානයෙකින් කටයුතු කිරීම තුළින් රාජ්‍යයක් ඉදිරියට පවත්වාගෙන යා හැකි බව මින් ගම්‍යමාන කරනු ලබයි. එසේම ධාර්මික වූ යම් කෙනෙක් සප්ත අපරිහානි ධර්ම අනුගමනය කරමින් කටයුතු කරන්නේ ඔහු කිසිවෙකුටත් පැරදවිය නොහැකි බව වස්සකාර ඇමතියාද පිළිගෙන ඇති බව සඳහන් වේ. ඔහුගේ වෘද්ධිය මිස පරිහානියක් කිසිදා දැකිය නොහැකිය. (එකෙමෙකෙනපි හො

ගොතම අපරිහානියෙන ධම්මේන සමන්නාගතං වජ්ජීනං වුද්ධියෙව පාටිබංකා නො පරිහානි)[11]

දානය ප්‍රියවචනය අර්ථචර්යාව හා සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තු ධර්මයන් පවතින්නේ බුදුරජුන් තුළය. දිනක් භික්ෂූන් අමතා බුදුරජුන් තමන් සතු එම ගුණ ධර්මයන් පැහැදිලි කර දෙයි. එසේම එම ගුණ ධර්මයන් ගිහි ගෙයි වසන යම් රජ කෙනෙක් තුළ පවතින්නේනම් ඔහුට මහත් ප්‍රතිලාභ ලැබෙන්නේය. එනම් මනාව සංග්‍රහකරන ලද පිරිවර සේනාව, බ්‍රාහ්මණ ගෘහපතීන්, නියම්ගම් ජනපදවාසීන්, ගණකාචාර්යවරුන්, ශරීරාරක්ෂකයන්, දොරටුපල්ලන්, ඇමතියන්, පිරිවර ජනයා රාජභෝගී කුමාරවරුන් යනාදීහු ලබන්නේය. (සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති, රජා හොති චක්කවත්ති......... රාජා සමානො කිං ලභති? සුචිපරිවාරො හොති. සුචිස්ස හොන්ති පරිවාරා බ්‍රාහ්මණගහපතිකා නෙගමජානපදා ගණකා මහාමත්තා අනීකට්ඨා දොවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො හොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති)[12] මේ අනුව සතර සංග්‍රහ වස්තුවෙන් යුක්ත රජු සියලු දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වන්නේය. ඔහු සැම අතින්ම සමෘද්ධිමත් පුද්ගලයෙක් වන විට රට නිතැතින් ම සංවර්ධනය කරා ගමන් කරයි. රට සංවර්ධනය වීම රජුගේ කීර්තිය ප්‍රශංසාව වැඩි දියුණු වීමට ද ඉවහල් වේ.

රාජ්‍ය පාලනයේ දී රජු විසින් අනුගමනය කළයුතු තවත් අංගයක් වන්නේ දස රාජ ධර්මයන්ට අනුව රාජ්‍යය



ගෙන යාමයි. දානය, සීලය, පරිත්‍යාගය, අවංක බව, මෘදු බව, තපස් ගුණ ඇති බව, ක්‍රෝධ නොකිරීම, අවිහිංසාව, ඉවසීම හා එකඟ බව යන ඒවා දස රාජ ධර්ම වශයෙන් දැක්විය හැකිය.

(දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං
අක්කෝධො අවිහිංසඤ්ච, ඛන්තිඤ්ච අවිරොධනං)[13]

ඉහතින් සඳහන් කළ ගුණ ධර්මයන් රාජ්‍ය කරවන විට ඇතුළු ජනයා කෙරෙහි මෙන් ම රටවැසියා කෙරෙහි ද එකසේ අනුගමනය කළ යුතුය. ඇතැම් රජවරු තම පාක්ෂිකයන්ට පමණක් එක් ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන අතර රට වැසියා කෙරෙහි දක්වන්නේ වෙනත් ක්‍රියා පිළිවෙතකි. සැම දෙනා ම තමාගේ දරුවන් සේ සලකා කටයුතු කිරීම රජ කෙනෙකුගේ යුතුකමක් වන්නේය. වෙන් වෙන් වූ ආකාරයෙන් කටයුතු සිදු කරන විට ඇති වන්නේ රජු කෙරෙහි අප්‍රසාදයකි.

රාජ්‍ය පාලනයේ දී රජු විසින් අනුගමනය කළයුතු තවත් අංගයක් ලෙස ධාර්මික බව පෙන්වා දිය හැකිය. අංගුත්තර නිකායේ චතුක්ක නිපාත පාළියේ අධම්මික සූත්‍රයට අනුව රජු අධාර්මික වීම නිසා ඇති වන්නා වූ ප්‍රතිවිපාකයන් පිළිවෙළින් දක්වා තිබේ. රජු අධාර්මික වූ විට ඔහු වටා සිටින පුද්ගලයින් අධාර්මික වේ. ඔවුන් අධාර්මික වූ විට බ්‍රාහ්මණ ගෘහපතිහු අධාර්මික වෙති. ඔවුන් අධාර්මික වූ විට නියම්ගම් ජනපදවාසීහු අධාර්මික වෙති. ඔවුන් අධාර්මික වූ විට සඳ හිරු නිසියාකාරව නොපායයි. සඳ හිරු වෙනස් වන විට

නැකැත් තරු ආදිය ද වෙනස් වේ. නැකැත් තරු ආදිය වෙනස් වූ විට රෑ දවල් කියා වෙනසක් ඇති නොවේ. එසේ වූ විට විසම වූ මාස ගෙවීම, ඍතු ගෙවීම ආදිය සිදු වේ. එසේ වූ විට දෙවියෝ කෝප වෙති. දෙවියෝ කෝප වූ විට නිසි වෙලාවට වැස්ස නොවසී. වැස්ස අවැසි කාලයේ නොවැස වෙනත් කාලවලදී ආ විට ගොයම් ආදී ශස්‍යයෝ නිසි පරිදි අස්වැන්නක් ලබා නොදෙයි. නිසි පරිදි අස්වැන්න නොවුණා වූ ශස්‍යයෝ අනුභව කරන මිනිස්සු ලෙඩ වෙති. එයින් ඔවුන්ගේ ආයුෂ වර්ණ ආදිය පිරිහීමට හේතුවක් වේ.[14]

සූත්‍රාගත තොරතුරු අනුව රජු ධාර්මික වීම රටවැසියා ධාර්මික වීමට හේතුවක් වේ. ආදි වශයෙන් එකිනෙකට සම්බන්ධතාව ඇති වී රට සමෘද්ධිමත් වන ආකාරය ද පෙන්වා දී තිබේ.

ඉහතින් සඳහන් කළ න්‍යාය බුද්ධ දේශනාවේ කේන්ද්‍රීය ඉගැන්වීමක් වන පටිච්චසමුප්පාදය හා සන්සන්දනය කළ හැකිය. හේතුව ඇතිකළ ඇති කළ ඵලය ඇති වේ. එය නැති කළ එය නොවේ යන්න මෙයින් ගම්‍යමාන වේ. මේ අනුව රටක් දියුණු වීමට රාජ්‍ය පාලනය කරන රජු ධාර්මික පුද්ගලයෙකු වියයුතු බව මෙයින් පෙන්වා දී තිබේ.



## රජවරු පිළිබඳ බෞද්ධ මතය

රාජ්‍යය හා රාජ්‍ය පාලනය පිළිබඳ බුදු දහමේ දැක්වෙන ආකල්පය මෙන් ම රජවරු පිළිබඳ ව ද විවිධ ආකල්ප දක්වමින් බෞද්ධ මතය ඉදිරිපත් කර ඇති බව ත්‍රිපිටකාගත දේශනා තුළින් පැහැදිලි වේ. ඒ අනුව මූලිකව රජවරු සතු විවිධ බලතල උන්වහන්සේගේ අවධානයට යොමු වී තිබේ.

"ඉස්සරිය බලා රාජානො"[15]

"රජවරු වනාහි ඓශ්වර්යය බලය කොට ඇත්තාහ." රජවරුන්ගේ ආරක්ෂාව පිණිස සිටින්නේ ඇත්, අස්, රිය, පාබල යන සිව්රඟ සේනාවෝය. රජු වටා පුරෝහිත බමුණා, සෙන්පති, ගණකාධිකාරී, විවිධ විෂයන් කෙරෙහි සිටින උපදේශකවරු ආදීන්ගෙන් සමන්විතය. රාජසනයේ සිටින රජුට රූමත් කාන්තාවන් විසින් පවන් සලනු ලැබේ. පා දෝවනයට, නැවීමට, කෙස් රවුල් බෑමට (කරණවෑමියා) ඉවුම් පිහුම් කර දීමට (අරක්කැමියා) රජුගේ ගුණ ගායනා කිරීමට (වන්දිභට්ටයෝ) සපිරිවර සේනාවක් නිතර සිටිති. ඇතුළු ජනයා මෙන් ම රට වැසියෝ රජුට පක්ෂපාතීව සිටිති. මේ නිසා රජුගේ තේජස බලසම්පන්න වේ. එබැවින් රජු වනාහි මහත් ආශ්චර්යමත් පුද්ගලයෙකි. එම ඉසුරුමත් බව රජෙක් තුළ පවතිනතාක් කල් ඔහුගේ බලය ද පවතී.

"දුරාසදාහි රාජානො අග්ගිපජ්ජලිතො යථා"[16]

"දිලිසෙන ගින්නක් මෙන් රජවරු කරා එළඹිය නොහැකිය." ගින්න සුළුවෙන් පටන්ගෙන මහා ගින්නක්

බවට පත්වේ. ගින්න පත්තු කරන විට ඒ අසල සිටිය හැකිමුත් එය මහා ගින්නක් බවට පත් වූ විට ඒ අසලට කෙනෙකුට ලෙහෙසියෙන් යාමට හෝ නිවා දැමීමට නොහැකිය. එසේම රජ කුමරා කුමාර අවධියේ දී සියල්ලන් ලඟ ෂිටිනමුත් යම් දවසක රාජ්‍යයට පත් වේ. එසේ රාජ්‍යයට පත් වූ රජුගේ සිංහාසනය හෝ සිරියහන් ගබඩාවට යන තෙක් සියලු දොරවල් ආඥා කරන දොරටුපල්ලෝ සිටිති. හාත්පස පවුරු බැඳ ඇතුළු විය නොහැකි සේ විවිධ ආරක්ෂක ක්‍රම භාවිත වේ. ඒ සියලු දෙයින් බේරී රජු කරා කිසිවෙකුට ලංවිය නොහැකිය. එසේ සිටින රජවරුන් ප්‍රවේශමෙන් ආශ්‍රය කළ යුතුය. කුණාල ජාතකයේ දී ප්‍රවේශමෙන් ඇසුරු කළයුතු පුද්ගලයින්ගේ නාම ලේඛනයට රජු ද අයත් වේ.

''සතාසනං කුඤ්ජරං කණ්හසප්පං
මුද්ධාභිසිත්තං පමදා ච සබ්බා
එතේ නරො නිච්චයත්තෝ භජෙථ
තෙසං හවේ දුබ්බිදු සච්චභාවො''[17]

ගින්න ද, ඇතා ද, කෘෂ්ණ සර්පයාද, රජු ද, සියලු ස්ත්‍රීහු ද යන මොවුන් මනුෂ්‍ය තෙමෙ සිහි ඇත්තෙක්ව සේවනය කළ යුතුය. ඒකාන්තයෙන් ඔවුන්ගෙන් ඇති තතු දැන ගැනීම අති දුෂ්කරය.

බුදුරජුන්ගේ දේශනාවට අනුව ලෝකයේ පහළවන පුද්ගලයන් අතුරින් ආශ්චර්ය අද්භුත පුද්ගලයින් දෙදෙනෙකි. එයින් එක් අයෙක් සම්මා සම්බුදුරජුන්ය. අනෙක් කෙනා චක්‍රවර්ති රජතුමාය.



''ද්වේ මේ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජන්ති අච්ඡරිය මනුස්සා. කතාම ද්වේ? තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජ ච චක්කවත්ති.''

ලොවුතුරා බුදු කෙනෙක් ලොව පහළ වන්නේ කල්ප ගණනකට පසුවය. ඒ පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී යන පාරමිතාවන් සමතිස් ආකාරයෙන් පූරණය කොට මාර පරාජය කිරීමෙන් අනතුරුවය. උන්වහන්සේගේ පහළවීම මුළු මහත් සත්ත්ව ප්‍රජාවට ම සැනසීමට කරුණක් වෙයි. සසර දුකින් එතෙර කිරීම පිණිස උන්වහන්සේලා ධර්මය දේශනා කරති. එසේම උන්වහන්සේලාගේ පිරිනිවන් පෑම සියලු දෙනාගේ සන්තාපයට හේතුවක් වෙයි. සක්විති රජ කෙනෙක් ලොව පහළ වන්නේ ද බොහෝ කාලයකට පසුවය. ඔහු සිව්මහා සාගරය කෙළවර කර ඇති පෘථුවිය පාලනය කරන්නේ ධාර්මිකවය. එබැවින් මිනිසුන්ට ඔහුගේ පහළ වීම මහත් අසවැසිල්ලක් වන්නේය. ඔවුන්ගේ නැති වීම පශ්චාත්තාපයට හේතු වේ.[18] ඒ අනුව මේ දෙදෙනාම ලොව පහළවන ආශ්චර්ය අද්භුත චරිත දෙකකි. රජවරු පිළිබඳ දක්වා ඇති තවත් හැඳින්වීමක් වන්නේ:-

''රාජා මුඛං මනුස්සානං''[19]

''රජු මිනිසුන්ට ප්‍රමුඛ වේ.'' පෘථුවිය පාලනය කරන්නේ රජු විසිනි. එබැවින් රජුට 'භූපති'[20] යන නම ව්‍යවහාර වේ. සත්ත්ව ප්‍රජාව පාලනය කරන බැවින් රජු සමාජයේ ප්‍රමුඛයා වේ. සියලු දෙනා ඔහුට යටහත් පහත් ගති පැවතුම් ඇති කරගෙන සිටිය යුතුය. සාමකාමී සමාජයක රජු අන් අයට වඩා ඉහළින් සිටින නිසා සියලු දෙනාගේ කටයුතුවල දී ප්‍රමුඛස්ථානය හිමි වේ. මනුෂ්‍යයින් අතර ඉහළ

ම පදවිය රජකමට පත්වීමයි. ඒ තත්ත්වය ලැබෙන්නේ වරකට එක් අයෙකුට පමණි. එසේ පත්වන පුද්ගලයා සියලු මිනිසුන් අතර ප්‍රධානියා ද වේ. ඕනෑම කාරණයක දී තීන්දු තීරණ ගනු ලබන්නේ ඔහු විසිනි. එබැවින් ඔහුට නිතර ම මිනිසුන්ගේ ප්‍රමුඛතාව හිමි වේ.

''රාජා රට්ඨස්ස පඤ්ඤානං''[21]

''රජු රටට ප්‍රඥාවන්තයෙක් වේ'' මිනිසුන් විසින් සිදුකරන වැරදි ක්‍රියාවන් විමසා බලා නිසි දඬුවම් දෙන්නේ රජුය. එවැනි තීරණවල දී රජු අනිවාර්යයෙන් ප්‍රඥාවන්තයෙකු විය යුතුය. නැතහොත් උසාවි ශාලාවේ දී ඔහු ගනු ලබන තීරණය වැරදී යා හැකිය. සියල්ල මැනවින් විමසා දඬවම් ලබා දිය යුතුය. සුමංගල ජාතකයේ දී රජු තමා පිළිබඳව නිර්වචනය කර ඇත්තේ මෙසේය.

''රාජාහමස්මි නරපදානමිස්සරො
සචෙසි කුජ්ඣාමි ඨපෙමි අත්තනං
නිසෙධයන්තො ජනතං තථාවිධං
පණෙමි දණ්ඩං අනුකම්පයොනිසො''[22]

රජු ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ ස්වාමියාය. ඇතැම් විට ඔහු යම් යම් හේතු කාරණා නිසා කිපෙන සුළු චරිතයක් ද වේ. එනමුත් නීතිය මත පිහිටා ඒ ආකාරයෙන් ම ඉටු කිරීම රජුගේ වගකීමය. ජනයා මග නොමග යාම වළක්වාලිය නොහැක. එසේ යන අය රාජ සභාවට ගෙන්වාගෙන ඔහු කෙරෙහිත් අනුකම්පා සහගත පිළිවෙතක සිට වරදට සුදුසු දඬුවම් නියම කිරීම නුවණින් විමසා බලා කළයුතුය. එසේ සුපරීක්ෂාකාරී නොවී කටයුතු කරන රජ කෙනෙක් වේ නම් ඔහු රජකමට නුසුදුසු වන බව පෙන්වා දී තිබේ. මෙහි



ප්‍රඥාවන්ත වීම යනු රාජ්‍ය විචාරීමේ ඇති දැනුම වර්ධනය වීමයි. රාජ්‍යය විචාරීම සඳහා තමා දැනුමෙන් පෝෂණය වියයුතුය. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීම පිණිස රජුට උපදේශක මණ්ඩලයක් ද වෙයි. ඒ අයගේ උපදෙස් මත මනාව තීන්දු තීරණ ගැනීමේ වගකීම රජු සතුය. වරදට ලක් වූවන්ට නිසි දඬුවම් ලබාදීම ඉන් අනතුරුව සිදු වේ. එබැවින් රජු අන් අය අතර ප්‍රඥාවන්තයෙක් වෙයි. එය රටක් ගොඩ නැගීම සඳහා බෙහෙවින් ඉවහල් වේ.

''රාජා න සාධු අනිසම්මකාරී''[23]

රජු සියල්ල සිදු කර යුතුතේ සියල්ල විමසා බැලීමෙන් යුක්තවය. එසේ නොවන කෙනා රජකමට නුසුදුස්සෙකු වේ. පහත කියමනෙන් එය පැහැදිලි වේ.

''යෙ ඛත්තියා අනිසම්මකාරිනො
පණෙන්ති දණ්ඩං සහසා පමුච්ඡිතා
අවණ්ණසංයුත්තා ජහන්ති ජීවිතං
ඉතො විමුත්තාපි ච යන්ති දුග්ගතිං''[24]

යම් රජ කෙනෙක් කරුණු කාරණාවන් නොවිමසා කෝපයෙන් යමක් නොකළ යුතුය. මුලාවට පත්ව දඬුවම් ආදිය නියම නොකළ යුතුය. එසේ කරන යම් රජ කෙනෙක් වේ නම් ඔහුගේ කීර්තිය ලොව පුරා පැතිරෙන්නේ දූෂ්ඨ පාලකයෙකු කියාය. ඔහුට සතුරෝ වැඩි වේ. අවසානයේ ජීවිතයෙන් ද වන්දි ගෙවීමට සිදු වේ. මරණින් පසු ඔහුගේ ගමන අපාය කරා පියනඟයි. වැරදි කරන්නා සේම වැරදි තීරණ ගෙන කටයුතු කරන්නා ද පාපකාරී පුද්ගලයෙක් වේ.

පව් කිරීම මෙලොව පරලොව තැවීමට හේතුවක් වෙයි. (පාපකාරී උභයත්ථ තප්පති)[25]

රාජ්‍ය ගෙන යන රජවරුන්ගේ ස්වභාවය මෙබඳු යැයි දේශිත අතර තත්කාලීන රාජ්‍ය ගෙන ගිය රජවරුන් පිළිබඳ ව ද බුදුරජුන්ගේ ආකල්පය කෙබඳු දැයි වටහා ගත යුතුය. ඒ අනුව බොහෝ රජවරුන්ට බුදුරජුන්ගේ ප්‍රසාදය හිමි වී තිබෙන අතර ඇතැම් විට වැරදි පාලකයන් පිළිබඳ ව අප්‍රසාදයෙන් සිටි බව ද ත්‍රිපිටකාගත තොරතුරු විමර්ශනය කිරීමෙන් පැහැදිලි වෙයි. ඒ අනුව බුදුරජුන්ට හමු වූ පළමු රජතුමා වන්නේ එකල සොළොස් මහ ජනපද අතරින් ප්‍රධානතම රාජ්‍යයක් වූ මගධ රාජ්‍යයේ පාලනය ගෙන ගිය බිම්බිසාර රජතුමාය. බුද්ධත්වයට පත්වීමෙන් පසු තම රාජ්‍යයට වැඩම කරන ලෙස ඉල්ලා සිටියේ සිද්ධාර්ථ තාපස අවධියේ සිටය. එම ඉල්ලීමට අනුව බුද්ධත්වයට පත් උන්වහන්සේ රජගහ නුවරට වැඩම කළහ. බුදුන් සරණ ගිය රජු ධාර්මිකව මගධ රාජ්‍යය පාලනය කළේය. බුදුරජුන් ඔහු පිළිබඳව අදහස් දක්වා ඇත්තේ මෙසේය.

''රාජා මාගධො සෙනියෝ බිම්බිසාරෝ ධම්මිකො ධම්මරාජා''[26]

මගධ සෙන්පති බිම්බිසාර ධාර්මික රජ කෙනෙකි. මෙහිදී බුදුරජුන් බිම්බිසාර රජු විශේෂණ පද දෙකකින් හඳුන්වා ඇත. මාගධො (මගධ වැසි) හා සෙනියො (සේනාවට අයිති) යන්නයි. රජු ධාර්මික වූයේ කෙසේද යන්න බොහෝ සූත්‍රවල දී පෙන්වා දී ඇත. ''රාජා මගධො සෙනියො බිම්බිසාරො සපුත්තො සභරියො සපරිසො සාමච්චො



පාණෙහි සරණං ගතො''[27] ඔහු පුතුන්, භාර්යාව, පිරිස, ඇමතියන් සහිත සියලු දෙනා ම සමග බුදුන් දහම් සඟුන් සරණ ගිය කෙනෙකි. මෙම ප්‍රකාශය තුළින් ගම්‍යමාන වන්නේ ඔහුගේ පුත් අජාසත් පවා මුලදී තෙරුවන් සරණ ගිය පුද්ගලයෙකු වූ බවය. බෝධිසත්ත්වයින් වහන්සේගේ චරිත දෙස බැලූ කල උන්වහන්සේ රාජ්‍ය කරන සමයන්හි දී බෙහෙවින් ධාර්මික වූ අතර යම් තාපසයෙක් හෝ නුවණැත්තෙක් වී ඉපිදුනු අවස්ථාවල දී රජවරුන්ට ධාර්මිකව රාජ්‍ය ගෙන යන ලෙස ද උපදෙස් දී තිබේ. ධාර්මික බව රාජ්‍යයක් ගෙන යාමේ දී බෙහෙවින් ඉවහල් වන බව මෙයින් පැහැදිලි වේ. ධාර්මික බවේ සංකේතයට සාම ජාතකය කදිම නිදසුනකි.

''ධම්මං චර මහාරාජ මිත්තාමච්චේසු ඛත්තිය
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි''[28]

ධාර්මිකව හැසිරීම යනු සියලු දෙනා කෙරෙහි එක හා සමාන ව කටයුතු කිරීමය. එසේ යම් කෙනෙක් ධාර්මික ව වාසය කොට මරණින් පසු ස්වර්ගගාමී විය හැකි බව පෙන්වා දී ඒ සඳහා කටයුතු කරන ලෙස රජුට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව බුදුරජුන් ඉහත ප්‍රකාශය තුළින් බිම්බිසාර රජුගේ ධාර්මිකත්වය ද ප්‍රස්තුත වන ආකාරයෙන් දේශනා කර ඇති බව පෙනේ. රජු කිසි විටෙකත් කිසිවෙකු කෙරෙහි කුපිත වී නැත. වරක් බුදුරජුන් කෝසල රජුගෙන් බිම්බිසාර රජු පිළිබඳ ව කරුණු විමසයි. එහිදී කොසොල් රජු පවසා ඇත්තේ ''න බො මෙ භන්තෙ අද්දසි, රාජා මගධො සෙනියො බිම්බිසාරො කුපිතො''[29] යනුවෙනි. තමා කිසි විටෙකත්

බිම්බිසාර රජු කුපිත වී සිටිනව දැක නැති බවය. තම පුත් අජාසත් රජු විසින් බන්ධනාගාර ගත කොට කුරිරු වද බන්ධන ලබා දෙන අවස්ථාවේ වුවත් ඔහු කෙරෙහි කිසිදු ද්වේෂයක් ඇති නොකර ගත් බව ප්‍රකටය. බුදුරජුන් වෙත සපැමිණි අවස්ථාවන් වලදී උන්වහන්සේ සමග ධාර්මිකව සතුටු සාමිචියේ තියුතු වූ බව කියවේ. මේ අනුව බුදුරජුන් බිම්බිසාර රජුට ධාර්මික රජ කෙනෙක් යැයි ඇගවීම සාධාරණය.

කෝසල රාජ්‍යය ගෙනගිය පසේනදි කොසොල් මහරජතුමා බුදුරජුන්ගේ ඇගයීමට ලක් වූ සුවිශේෂිත චරිතයකි. ''පසෙනදී කොසලො කල්‍යාණ සහායො''[30] කොසොල් රජතුමා ද 'පසේනදී' යන විශේෂණ නාමයෙන් හඳුන්වා ඇත. 'ප්‍රසාදය ඇත්තා' යන්න එහි තේරුමයි. කොසොල් රජු විශේෂයෙන් බුදුරජුන් කෙරෙහි ප්‍රසාදයෙන් සිටි කෙනෙකි. ඕනෑම ගැටළුවක් පැමිණි අවස්ථාවේ දී බුදුරජුන් වෙත ගොස් කරුණු විමසා ඇත. එබැවින් නිතර බුදුන්ගේ ප්‍රසාදයට ද පාත්‍ර වී තිබේ. (රාජා පසෙනදී කොසලො තථාගතෙ නිපච්චකාරං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලීකම්මං සාමිචිකම්මං)[31] මෙහි කල්‍යාණ සහායකයන් ඇති බව වැඩි දුරටත් සඳහන් වී ඇත. මේ කල්‍යාණ සහායකයෝ වනාහි බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය ම වේ. ඒ අනුව බුදුන් පමණක් නොව ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි මහත් ශ්‍රද්ධාවකින් කටයුතු කළ ඔහු ඒ සියල්ලෝගේ ම ප්‍රසාදය ද ලබාගෙන ඇත. ප්‍රසාදය ඇති තැනැත්තන් ම



සේවනය කළ යුතුය. අප්‍රසන්න වූවත් දුරින් ම අත් හළ යුතුය. දිය කැමැති කෙනෙක් ඒ සඳහා ගැඹුරු මහ විලක් අපේක්ෂා කරන්නේ යම් සේ ද එසේම සියල්ලෝ සැදැහැවතෙක් ම ඇසුරු කළ යුතුය.[32] ඒබ ව පහත ගාථාවෙන් පැහැදිලි වෙයි.

''පසන්නමෙව සෙවෙය්‍ය අප්පසන්නං විවජ්ජයෙ
පසන්නං පයිරුපාසෙය්‍ය රහදංවොදකත්ථිකො''

කොසොල් රජු පිළිබඳ හඳුන්වා ඇති තවත් ස්ථානයක් ලෙස

''පසෙනදී කොසලො කල්‍යාණ සංපවඩ්ඪකො''[33]

කොසොල් රජු කල්‍යාණ මිතුරන් කෙරෙහි නැමුණු කෙනෙකි. කල්‍යාණ මිත්‍රයෝ සතර දෙනෙකි. උපකාරක, සමාන සුඛදුක්ඛ, අත්ථක්ඛායි හා අනුකම්පක වශයෙනි. තමන්ට යම් අවශ්‍යතාවක් ඇති වූ විට යමක් කරන්නේ උපකාරක මිත්‍රයායි. සැපේදී හා දුකේදී එක සේ සිටින්නේ සමාන සුඛදුක්ඛ මිත්‍රයායි. වැඩදායී යමක් කරන්නේ අත්ථක්ඛායි මිත්‍රයායි. කරදරේ වැටුණු මිතුරාට අනුකම්පා කොට පිහිට වන්නේ අනුකම්පක මිත්‍රයායි. කල්‍යාණ මිතුරන් ඇසුරු කළ යුතු බවත් පාප මිතුරන් භජනය නොකළ යුතු බවත් බුදුරජුන් විසින් දේශනා කර තිබේ.[34]

''න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙ''

රජු ඇසුරු කළ මිත්‍රයින් වූයේ බුද්ධාදී උතුමන් වහන්සේලාය. උන්වහන්සේලා රජු කෙරෙහි කල්‍යාණ මිත්‍රයෝ වූහ. රජුට ඕනෑම වෙලාවක විහාරයට යාමට බුදුන් හමුවීමට අවස්ථාව තිබුණි. දිනපතා බුදුන් හමුවට පැමිණියත්

ඒ කිසිදු අවස්ථාවක බුදුන් මගහැරුණු අවස්ථාවක් දක්නට නොමැත. ඒසේම බුද්ධාදී උතුමන් වහන්සේලාගේ අවවාද අනුශාසනා මැනවින් පිළිපදිමින් තම රාජ්‍යය ගෙන ගිය කෙනෙක් ලෙස කොසොල් රජු හැඳින්විය හැකිය. මොහු ද බිම්බිසාර රජු මෙන් ම තම පුතුන් භාර්යාව පිරිස ඇමති ආදී සියල්ලෝ ම බුදුන් සරණ ගොස් සිටි කෙනෙකි. (රාජා පසෙනදී කොසලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො)[35]

"රාජා මහාවිජිතො උභතො සුජාතො"[36]

මහාවිජිතාවි රජු පෙර සිටි සක්විති රජ කෙනෙකි. ඔහුගේ කුල පරම්පරාව පිළිබඳ ව දැක්වීමේදී මව්පිය දෙපාර්ශ්වයෙන් ම පිරිසිදු බව කීම සඳහා ඉහත පාඨය යොදා ඇත.

"අජාතසත්තු වෙදෙහිපුත්තො පාපසහායො"[37]

බිම්බිසාර රජු බුදුන්ගේ ප්‍රසාදයට පාත්‍රව සිටියත් ඔහුගේ පුත් අජාසත් රජු පිළිබඳ ව බුදුන්ගේ ප්‍රසාදයක් නොතිබූ බව ඉහත පාඨයෙන් පැහැදිලි වෙයි. ඔහු දේවදත්ත හිමියන් සමග එක්ව කටයුතු කිරීම පාප මිත්‍ර සේවනයක් සේ සලකා මෙවැනි හැඳින්වීමක් කර ඇත. ඇසුරු නොකළ යුතු පාප මිත්‍රයෝ සතර දෙනෙකි. අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභානි හා අපාය සහාය යනුවෙනි. යමක් ගෙනයාමේ අදහසින් පැමිණෙන්නේ අඤ්ඤදත්ථුහර මිත්‍රයායි. වචනයෙන් සංග්‍රහ කරන්නේ වචීපරම මිත්‍රයායි. නැති තැන අගුණ කියන ඉන්නා තැන ගුණ කියන්නා අනුප්පියභාණි මිත්‍රයායි. වැරදි දෙවල් වලට සහාය දෙන්නා අපාය සහාය මිත්‍රයායි. මෙයින්



දේවදත්ත හිමියන් අජාසත් රජු වැරදි වැඩ කෙරෙහි යොදවා ගත් කෙනෙකි. මේ හේතුව නිසා බුදුරජුන් 'පාපසහාය' යන නම අජාසත් රජු වෙත භාවිත කර ඇත. මෙම ප්‍රකාශයෙහි වෙදෙහිපුත්ත යනුවෙන් අජාසත් රජු හඳුන්වා දී තිබේ. විදේහ රටෙහි උපත් බැවින් එනමින් හඳුන්වා ඇත. අජාසත් රජු රාජ්‍ය කළ මගධ රාජ්‍යය අයත් වන්නේ විදේහ රටටය.

"අජාතසත්තු වෙදහිපුත්තො පාපසංවඩ්ඪකො"[38]

පාප මිත්‍රයා හැඳින්වීම සඳහා ත්‍රිපිටකයෙහි යොදා ඇති පාරිභාෂික වචන බොහෝය. මේ වනාහි ඉන් එකකි.

අජාසත් රජු පසු කාලයේ බුදුන් සරණ ගිය පුද්ගලයෙකු විය. ඔහු බුදුන් සරණ යාමට පෙර පැවති තත්ත්වය මෙයින් ගම්‍යමාන වේ. රජු නිතර පව්ටන් කෙරෙහි සිත් නැමුණේ වෙයි. දේවදත්ත හිමියන්ගේ බස් ඇසූ අජාසත් රජු පියා මැරීම, නාලාගිරි ඇතා රා පොවා බුදුරජුන් මැරවීමට යැවීම, දුනුවායන් යෙදීම සිදු කළේය. හුදෙක් අයහපත් දේ කළයුතු යැයි කී පමණින් සිදු කරන්නේ ඔවුන් කෙරෙහි සිත් නැවීම හේතු කරගෙනය. අජාසත් රජුට ද සිදු වූයේ එයමය. දේවදත්ත හිමියන්ගේ බස් ඉවත නොදැමිය හැකි නිසා ඒ සඳහා සිත් යොමු විය. රජුගේ සිත පව්ටන් කෙරෙහි සිත් යොමු වූ නිසා බුදුරජුන් ඔහු පිළිබඳ හැඳින්වීමට මෙවැනි වචනයක් භාවිත කර තිබේ.

## නිගමනය

ඉහතින් විමසීමට ලක් වූ ප්‍රස්තුත මගින් රාජ්‍යයේ ප්‍රභවය, රාජ්‍ය පාලනය හා රජවරු පිළිබඳ කරුණු රාශියක්

උද්ගත වෙයි. රාජ්‍යය නැමති සංස්ථාව බිහි වූයේ මිනිසුන්ගේ කැමැත්ත මතය. යම් යම් කාරණාවලදී තීන්දු තීරණ ගැනීමේ බලය රජුට හිමි විය. රජු රටවැසියා පාලනය කිරීමේ භාරදූර වගකීම ගෙන ක්‍රියා කර ඇත. ඒ සඳහා වන රාජ්‍ය පාලනය ගෙන යා යුතු වූයේ දැහැමිවය. දැහැමිව රජකම් කිරීමට බුදුදහමෙන් උපදෙස් ලබා දී ඇත. සුපරීක්ෂාකාරී නොවීම රජතුමාගේ අයෝග්‍යත්වයට ද හේතුවන බව ආදි බුදුදහමෙහි සඳහන් වී ඇත. රජු අධාර්මික වූ කළ සියල්ල වෙනස් වේ. රජෙකු යටතේ සිටින රට වැසියා ද රජු ගැන අනිවාර්යයෙන් අවබෝධයක් ලබා ගත යුතුය. ඔවුන් රජුට පක්ෂපාතී විය යුතුය. දැහැමි රජ කෙනෙක් සිටියේ නම් ඔහු පිළිබඳ ප්‍රසාදයෙන් ද අදැහැමි වූ කෙනෙක් පිළිබඳ අප්‍රසාදයෙන් ද කරුණු ඉදිරිපත් කරන ආකාරය ආදි බුදු දහමෙන් පෙන්නුම් කරයි.

## ආන්තික සටහන්

1. දීඝනිකාය, පාථික වග්ග, අග්ගඤ්ඤ සුත්තං, හේවාවිතාරණ මුද්‍රණය, 2004, 156 පිටුව.
2. එම, 150 පිටුව.
3. එම, 156 පිටුව.
4. එම, 158 පිටුව.
5. මහාවස්තුව, 348 පිටුව.
6. දීඝනිකාය, පාථික වග්ග, අග්ගඤ්ඤ සුත්තං, හේවාවිතාරණ මුද්‍රණය, 2004, 158 පිටුව.



7. එම, චක්කවත්තිසීහනාද සුත්තං, 100, 102 පිටු.
8. එම, 112 පිටුව.
9. එම, 98 පිටුව.
10. එම, මහාවග්ග, මහාපරිනිබ්බාන සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 112-116 පිටු.
11. එම, 112 පිටුව.
12. දීඝනිකාය, පාථික වග්ග, ලක්ඛණ සුත්තං, හේවාවිතාරණ මුද්‍රණය, 2004, 284 පිටුව.
13. ඛුද්දක නිකාය, ජාතක පාළි ii, මහාහංසජාතකං, 4000 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 352 පිටුව.
14. අංගුත්තර නිකාය, චතුක්ක නිපාත පාළි, අධම්මික සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 126 පිටුව.
15. සංයුත්ත නිකාය 1, පඨමසංගාම සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 154 පිටුව.
16. ඛුද්දක නිකාය, ජාතක පාළි ii, සත්තිගුම්බ ජාතකං, 3502 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 300 පිටුව.
17. එම, කුණාල ජාතකං, 4149 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 400 පිටුව.
18. අංගුත්තර නිකාය 1, දුක නිපාත, බු. ජ. මු., 2005, 148 පිටුව.
19. ඛුද්දක නිකාය, සුත්තනිපාතය, සේල සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 178 පිටුව.
20. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1998, 373 පිටුව.
21. ඛුද්දක නිකාය, ජාතක පාළි iii, වෙස්සන්තර ජාතකං, 6649 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 410 පිටුව.
22. ඛුද්දක නිකාය, ජාතක පාළි i, සුමංගල ජාතකං, 1178 ගාථාව, ශ්‍රී

ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 308 පිටුව.

23. එම, රථලට්ඨී ජාතකං, 634 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 188 පිටුව.

24. එම සුමංගල ජාතකං, 1176 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 308 පිටුව.

25. ඛුද්දක නිකාය, ධම්මපද පාළි, යමක වග්ග, 17 ගාථාව, බු. ජ. මු. 1975, 28 පිටුව.

26. දීඝනිකාය ii, මහාවග්ගපාළි, ජනවසභ සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 308 පිටුව.

27. මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාස පාළි, බ්‍රාහ්මණවග්ග, වංකී සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 164 පිටුව.

28. ඛුද්දක නිකාය, ජාතක පාළි iii, සාම ජාතකං, 4735 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 76 පිටුව.

29. මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාස පාළි, රාජවග්ග, අංගුලිමාල සුත්තං, බු. ජ. මු. 1973, 146 පිටුව.

30. සංයුත්ත නිකාය 1, පඨමසංගාම සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 154 පිටුව.

31. දීඝනිකාය iii, පාථිකවග්ගපාළි, අග්ගඤ්ඤ සුත්තං, හේවාවිතාරණ මුද්‍රණය, 2004, 142 පිටුව.

32. ඛුද්දක නිකාය, ජාතක පාළි ii, මහාබෝධිජාතකං, 3456 ගාථාව, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 248 පිටුව.

33. සංයුත්ත නිකාය 1, පඨමසංගාම සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 154 පිටුව.

34. ඛුද්දක නිකාය, ධම්මපද පාළි, පණ්ඩිත වග්ග, 78 ගාථාව, බු. ජ. මු. 1975, 42 පිටුව.

35. මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාස පාළි, බ්‍රාහ්මණවග්ග, වංකී සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 166 පිටුව.



36. දීඝනිකාය i, සීලක්ඛන්ධවග්ගපාළි, කූටදන්ත සුත්තං, බු. ජ. මු. 1978, 264 පිටුව.

37. සංයුත්ත නිකාය 1, පඨමසංගාම සුත්තං, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, නැදිමාල, 2005, 154 පිටුව.

38. එම, 154 පිටුව.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
11 NOV 2017
පුස්තකාලය